# නිර්මාණ Nirmana

## අනුබුදු සුවඳ

දිදුලන මිහින්තලයෙහි අනුබුදුන් සේ
සැනසුම හදවතට ගෙනදුන් නිවන් සේ
හිමිසඳ මිහිඳු මහ රහතන් වහන් සේ
තවමත් මට පෙනේ ලොව්තුරු කසුන් සේ

වැඩහිඳ පොසොන් සඳ මෙන් අඹ තලාවේ
සැබිබව ගෙනා මෙ දිවට නිසි වෙලාවේ
හිමි සඳ නොවැඩියෙහි නම් හෙළ කලාවේ
අනුහස නොදත් අද අප මං මුලාවේ

බුදුබණ අනුව මගපල පෑ විසා රද
අනුබුදු මිහිඳු මහිමිගෙ ගුණ අසා අද
මදනල රැඟුම් දෙයි තුන් හෙළ දිසා වෙද
මහිමිගෙ අගය මට කොතරම් විසා ලද

නාවා දහම් සිසිලෙන් හෙළ දරණී තලේ
පෑ වා අපට මහපාදා කුළුණු බලේ
මේ වාසනා මැද ඉදි කළ ඉහළ පෙලේ
සේවා වක යෙදී දාගැබ් දසත දිලේ

ර න් මිණි කිරුළ නොරඳා පෙරදින සිරසේ
පෙන් වා කසාවත බුදු සව්වෙකු විලසේ
උ න් මෙහි මිහිඳු මාහිමියනි පිපි මලසේ
පි න් කළ පා පිසිනු මැන මගෙ බැති පළසේ

නි ව ට කමින් ගස් ගල් පෙර අප වැන්දා
ප ව ට හුරුව සිටි දන අසලට කැන්දා
තැනට සුදුසු සදහම් වදහළ සන්දා
අ ප ට හැකිවුණා නොවිදින්නට නින්දා

තෙද යස විදා හළ දිනකර මඬල මෙනී
සිරිලක බෙදාලූ සදහම් මියුරු පැණී
අනුබුදු පියා අසලින් එන සුවඳ දැනී
මගෙ හද පොසොන් පුරසඳ මෙන් සිනහ සුනී

නිගා නොවන මෙන් මුළු ලොව හතර වට
ව ගා කළෙන් සුසිරිත් දම් සුවඳ කැට
නගා යුගත අනුබුදු හිමිසඳුනි මට
දි ගා වන්න අවසර පා කමල යට

♦ *නාහල්ලේ පඤ්ඤානන්ද හිමි*
Sri Lanka

## හිමිගත් මග ගියා නම් !

පායයි මිහිඳු සඳ අඹතල පව්ව ළහින්
දුනු හී වැටුණි රජතුමෙකුගෙ ඇඟිලි අගින්
පැතිරුණු එළිය මෝහයෙ ගන අඳුර මගින්
අද මෙන් හෙටත් කලඑළිවෙයි සතර දිගින්

යුග යුග ගණන් ආ සමගිය කරුණා වේ
මහිමෙන් අදත් තුරුමත මල් පිරුණා වේ
සම්බුදුන් දෙසුව සිරි සදහම් වරුණා වේ
බල මහිමයෙන් ලොව සුවපත් කෙරුණා වේ

අනුබුදු සමිඳු ඇසු පැන විසඳා දුන්නූ
අගපත් වෙමින් නුවණැතියන් ලෙස උන්නූ
ඉපැරණි අසිරි සිරි මුලු ලොවටම පෙන්නූ
හෙළයන් හෙළයටම අබිමානය ගෙන්නූ

හිමි මෙහි වැඩියෙ අපෙ පෙර පින නිසා නම්
එදවස හෙළයෙ දම්දීපය වුණා නම්
අද ඒ තැනට එන්නට වුවමනා නම්
කොතරම් හොඳද හිමි ගත් මග ගියා නම්

එදවස වැටුණු මුත් දුනු බිම පිනින් හෙළේ
අද අත රැඳුණු අවි නොමිනිස්කමින් දිලේ
සාමය පතා මෙත් වැඩුමට නිසන් සලේ
පොසොන් පොහෝ දින අපි යමු මිහින් තලේ

♦ *ශීලා බාලසූරිය*
බිබිලාදෙණිය Sri Lanka

## පොසොන් උදානය


සුමියුරු විහඟ ගී නාදය පැතිර ගියේ
හිංසා මැකෙන පරිසරයක සිරිය තියේ
දැනිලා වගේ සීපාවුන් සතුටු වුයේ
සදහම් සිසිල ගෙන සුළඟකි හමා ගියේ

පුරහඳ පායලා අඹරේ පොසොන් දින
වැඩියේ මිහිඳු හිමි අපහට දහම ගෙන
හමුවී තිස්ස නිරිඳුන් සහ පිරිස වන
මිස්සක පව්ව මතදී දෙසූ මියුරු බණ

නැති කරලමින් හිංසාවට තිබුණු තැන
අවිහිංසාව පහදා යහ මගට ගෙන
වපුරා දහම් බිජු සිරිලක සතර කොණ
සරුවී වැඩී එය සදහම් දීපෙ විණ

නැහැමින් තිබෙන ගුණ සාරය නිසා වෙනී
දහමින් ලැබෙන සුව සහනය සිතට දැනී
බෙහෙවින් දිවිය සරුවුණි යහපත පැමිණී
පින්බර රටක ඉපදුන වාසනා වෙනී

♦ *විමලා යාපා* Lakadamia **Cyprus**



## මිහිඳු සමිඳු වැඩිය දිනයි !

මිහින්තලා කඳු මුදුනට අනුබුදු හිමි වඩින වා
බුදුන් දෙසූ අම දම් සුව ලක් දෙරණට හමන වා
පොසොන් පුරා පුන් පෝදා දහම් එළිය දිලෙන වා
බවුන්වඩා නිවන් මගට සැම දන සිත් යොමන වා

අපිත් එදා සිටියා නම් අනුබුදු හිමි වඳින වා
දොහොත් තබා හිමි පාමුල මෙත් සිසිලස විඳින වා
දනක් පුදා රහතුන් හට පාරමිතා පුරණ වා
කෙලෙස් නසා බව කතරේ එතෙරට පිය නගන වා

රුවන් මහා සෑ ඉදිවී අනුරපුරේ දිලෙන වා
මුවන් හැඹූ පැතිස් රජ බුදු සිසිලෙන් නිවෙන වා
මිහින්තලා අඹ වනයේ දන් සිල් පින් කරන වා
පිනක් බෙලෙන් ලක් දෙරණේ අප ඉපදී සිටින වා

♦ *සමන්මලී සේනානායක* **Luton UK**

## මෙසේ බුදු සසුන ලකඹර ජලිත විය

පැතිස් රජිඳු සිරිලක නරනිඳුව හිඳ
මුව දඩයමට වන ගතවී සිටින සඳ
බුදු පුත් මිහිඳු ගුවනින් ලක් බිමට වැද
දහමක් බෙදාදුනි රට වැසි සැමට හොඳ

අම්බස්තලය මිස්සක පර්වතය නමින්
අනුරාපුරය පසුකර තරමකට දුරින්
මහ වන ගැබේදී හමු වූ මිහිඳු හිමින්
පැණසා විමසීය රජ නැණ සොයන ලෙසින්

එදා සිටම ලක් අඹරේ බුදු සසුන
සදාතනික ලෙස පවතී මන ලෙසින
රඳාගෙන මිහිඳු නාමය බැති පෙමින
පුදා පතමු සෙත සත වෙත මෙත් සිතින

ලක්දිව බුදු සසුන පිහිටෙව් මිහිඳු හිමී
ලක්වැසි සැමට මිණි පහනක් වේ නොනිමී
සක් පිඹ සුවඳ මල් ගෙන සැදැහැයෙන් තෙමී
ලක් වැසියනි පුදමු හරණට සසර බැමී

අම්බස්තල මතින් බුදු රැස් විහිදේවා
ඒ බුදු රැස් දසත දිගතෙහි පැතිරේවා
සැම සිත් දැහැමිබව ලැබ නිති බැබළේවා
දුකඳුරු දුරුව ලෝ සත වෙත සෙත්වේවා!

♦ *ජිම් අබයරත්න* **Gardena CA. USA**

## අම්මා සඳකි

සම්මා ගුණෙන් යුතුවම මා ජනිත කෙරූ
නිම්මා නැති පෙමින් අහරින් මහත් කෙරූ
පෙම්මා වදන් බස් වහරින් සවන් පිරූ
අම්මා සඳකි මට මේ ලොව එළිය කෙරූ

සම්මා ඔවදනින් දිවියම පහන් කෙරූ
සම්මා මග මෙයයි කියමින් ගමන් කෙරූ
සම්මා එමග දෙනු වස් පිළවෙතින් පිරූ
අම්මා සඳකි මට මේ ලොව එළිය කෙරූ

ගනිමින් දහම් මග දම් පිළිවෙතින් පිරූ
නසමින් සසර මුල් බුදු පිළිවෙතින් සරූ
කියමින් ලොවේ අනියත බව ඇතිව හුරූ
අම්මා සඳකි මට මේ ලොව එළිය කෙරූ

උත්තම ගුණ නිසා ලොව මව් පදවි දැරූ
සිත්තම ඔබයි ලොව අමතක නොවන යුරූ
දිනිසුරු ලෙසින් මගෙ දිවියම පිනෙන් පිරූ
අම්මා සඳකි මට මේ ලොව එළිය කෙරූ

♦ *සුසන්ත ශ්‍රී අතුකෝරළ*
*විකිලිය බලන්ගොඩ* **Sri lanka**

## අනුබුදු හිමියනි !

අඹතල මුදුණේ මිස්සක පව්වේ
බැබළී හිනැහුණු පොසොන් සඳේ රැස්
නව දැලි හේනේ සිටි වැදිරිය සේ
මැකී ගියා ඔබ පැයූ මොහොතේ
අනුබුදු හිමිසඳුනේ
අඳුරු තිමිර බිඳලූ

සම්මා සම්බුදු ගිය මග යමිනේ
නිවන් පුරට මං සළකුණු කීවේ
අදත් ඇසෙයි ඒ සුමධුර රාවේ
සිරිලක සතර දෙසේ
අනුබුදු හිමි සඳුනේ
දහම් පහන දැල්වූ

දුනු හී අතහැර බොදුනු මගට වන්
දේවානම්පියතිස් නරනිඳු සේ
පවිටු දුදන සිත නිවැරදි කළ මැන
දෙසූ දම් අනුහසිනේ
අනුබුදු හිමි සඳුනේ
සසර ගමන සිඳලූ

♦ *ආචාර්ය ශ්‍රියා කුමාරසිංහ*
Dunedin **New Zealand**

## මිහිඳු දිනේ !

නීල ගගන තලේ
තරු පහන් කසුන් විලේ
ස්වර්ණ වර්ණ චන්ද්‍ර බිම්බ
දිලේ මිහිඳු දිනේ !

මලින් මලට සැදී
මිහිරි සුවඳ දිදී
ගසින් ගසට වැලින් වැලට
පැතිරෙයි නොම සිඳී !

ඇළ දොළ දිය ගලා
සඳකැන් නැහැවිලා
සයුර ගැඹුර වන් දම් හඬ
පුරා ගුවනෙ ගලා !

♦ *මාලපල්ලේ*
*කුමුදු රොහාන්*
*අමරසිංහ*
Edmonton, **London UK**

## පොසොන් පවත

පොසොන් සඳ පෙරඹර පුරා
නැගෙයි පවුවෙන් අඹතළා
මඳ පවන් වැද සැලෙන ලා පලුලු
කියයි පවතක් හඬනගා

දෙව් බඹුන් පිය තිස්ස තිස්ස ය
දුවනු කොහි දුනු හී දරා
ඔහොම නවතිනු අසනු මේ බස
පවස නිවනට මේ බිමේ

මමය අගරජ මෙසිරි ලක් බිම
කවුරු මට වැඩි මේ බිමේ
තිස්ස නාමෙන් මෙමා අමතන
කෙනෙක් නොදනමි මේ බිමේ
සමනා මයං මහාරාජ
ධම්මරාජස්ස සාවකා
තමෙව අනුකම්පාය
ජම්බුදීපා ඉධාගතා

අපය සමනුන් මහරජාණනි
දහම් සව්වන් මුනිඳුගේ
ඔබට වැඩ සාදන ලෙසින් මය
දඹදිවින් මෙහි පැමිණියේ

අපේ සිරි ලක අපේ දැය බස
අඹ පැණෙන් පිබිදුම් කළෝ
ඔබය සමිඳුනි මිහිඳු සමිඳුනි
අඹතළාවට වැඩම වූ

♦ *හෙන්රි කුමාරප්පෙරුම*
**Sydney Australia**

## පොසොන්

අම්බස්තල සිරස මතින්
දිස් වූ රුව ගැටෙන නෙතින්
කවුරුන්දැයි වියරු මතින්
නතර වුණෙූ පව්ව වෙතින්

අත දුණු හී බිම හෙළුණේ
රජුගෙන් පැනයකි ඇසුණේ
සහ ගණ රජ නෙත ගැටුණේ
එකත් පසෙක සිට ගැහුණේ

ලක් දීපය දහම් දියෙන්
නැහැවූ දින උතුම් පොසොන්
සිහිකරමින් පහන් සිතින්
සැනසෙමු ලොව්තුරු දහමින්

♦ *ජයන්ති සිරිවර්ධන*
**Kuwait**

## මහා දායාදය

මිහින්තලේ අඹ සෙවනේ සිහිල් සුවය ලද
සුළඟ සමග මුසුවී ඇත මියුරු දහම් පද
නිසංසලේ සවන් යොමා බණපද රස විඳ
සිරිලක් මව සැනසෙනවා අසමින් ඒ නද

තිස්ස කියා අමතන්නේ කවුද බැලූ විට
කසාවතින් බැබළෙනවා කඳු මුදුනේ සිට
මිහිඳු සමිඳු වැඩහුන් දා මිහින්තලා වට
දෙවියන් නැගූ සාදුකාර අදත් ඇසේ මට

එදා පැයූ හිරු සඳුමයි පායන්නෙත් අද
එදා දෙසූ බුදු දහමයි පවතින්නෙත් අද
එදා මෙදා නොවෙනස් වී දෙසූ දහම් පද
ඇසෙනා විට බැතිබර වී පිබිදෙනවා හද

පොසොන් උදාවෙන් අප ලත් මහ දායා දය
සුරකිමු අපි තව දෙදෙහස් වසරක් පන් සිය
බුද්ධ දම්ම සංඝ කියන මේ තුන් පන් තිය
නොවෙනස් වෙනවා ආවත් කල්ප විනා සය

♦ *අංජලී දිල්රුක්ෂි රත්නායක*
Montreal **France**

## නෙත් ලැබූ දා

සැපතක් යයි දුක් අරමුණු ලුහුබැඳ
නොමගට ගිය මිසදිටු ගතියෙන්
ව ර ද ක් සේ නොදුටුව පව්කම් මත
යෙදෙමින් නොඅඩුව සිත පිරියෙන්
සි රි ල ක් අප හට අනුකම්පාවෙන්
වැඩමකරන් දඹදිව් තලයෙන්
බ ව දු ක් නිවුමට අපහට මග පෑ
අනුබුදු හිමි නමදිමු බැතියෙන්

උ ද හ ස් වූ දා පවට එරෙහි තැන
මනුසත් දහමයි පලා ගියේ
නිකෙලෙස් දිවියක් එහෙයින් නොපෙනිණ
සැඩකම් සිත්වල පෙනී ගියේ
මෙ ම හි ස් දිවියෙන් අප අත් මුදවා
හඬ නැංවූයේ උදා නයේ
අ ද මි ස් සක පව්වෙන් ගොඩගැලූ ඒ
පිහිටෙන් සදහම් අමා දියේ
ල ද ස ත් දහමේ අනුහස මත දිවි
තතු තේරුම්ගෙන බොහොම හොඳින්
හ ර ව ත් දිවියක් පිළිගෙන මහ වැව්
දාගැබ් බැඳ බැතිබරව හදින්
ඔ ද ව ත් තෙදවත් දැයක් නගන්නට
ඉවහල් වන හැම දෙයම ලදින්
අපි නෙත් ලැබුවෙමු හරි මහ දැක්මට
පොසොන් සඳේ රැස් කැරළි මැදින්

♦ *ටී. කේ. අමරදාස - ගාල්ල* **Sri Lanka**

## from Salalihini Sandeshaya
### of Ven. Thotagamuve Sri Rahula Thera
### තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගේ
## සැළලිහිණි සංදේශයෙන්

**සු ර ර ද සමන් සමගින් සුරඟන එවර**
**පැහැනද මදාරා පරසතු මල් පතර**
**ක ර පු ද වඳින සැදි මුනි සිරිපා තඹර**
**ස කි ස ඳ පෙනේ සමනොළ ගල නැගණ හිර**

දයාබර මිතුර, ඔබ අහසට නැංගවිට ඔබට නැගණහිර දෙසින් පෙනෙන්නේ සුමන සමන් දිව්‍යරාජයා දිව්‍යාංගනාවන් සමග දෙව්ලොව මදාරා සහ පරසතු ගස්වලින් නෙලා ගත් මල් ද ගෙනගොස් වන්දනා කරන බුදුන් වහන්සේගේ ශ්‍රීපාද සළකුණ රැඳි සමනළ පර්වතයයි.

Surarada Saman samgin surangana evara
Pehenada Madaara Parasathu mal pathara
Karapuda vandina sedi muni siripa thambara
Sakisanda pene Samanola gala neganahira

Noble friend, when you rise up to the high heavens you will see on your east Mount Samanala (Adam's Peak) where Lord Buddha has imprinted his foot, and to which God Saman and the celestial damsels offer in adoration the flowers of the coral tree of Swarga (Mandara) and the divine tree of Indra's heaven (Parasathu)

## When we two parted

**If I should meet thee**
**After long years**
**How should I greet thee ?**
**With silence and tears !**

**හමුවේ නම් ඔබ**
**බෝ වසකට පසු**
**කෙලෙස පිළිගනිම් ?**
**නිහඬව... කඳුලින්....!**



**Lord Byron**
**බයිරන් කිවිඳු**